# 23 ශ්‍රද්ධාව නිවන් මගෙහි පිවිසුමයි

එක් සමයෙක භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ මේදතළුම්ප නම් ශාක්‍ය වංශිකයන්ගේ නියම් ගමෙහි වාසය කළහ. දිනක් කොසොල් රජතුමා එහි සැපත් වූයේ සපිරිවරිනි. බුදුරජාණන් වහන්සේ හමු වූ රජ තෙමේ උන්වහන්සේ සමග කළ දීර්ඝ සාකච්ඡාවේ දී හෙළි කළ එක් පුවතක මෙසේ දැක් වේ.

"ස්වාමීනී, යුද බිමෙහි සේනාව මෙහෙයවූ එක් අවස්ථාවක මම එක්තරා සම්බාධ සහිත තැනෙක රාත්‍රිය ගත කළෙමි. ඉසිදත්ත, පුරාණ නමැති වඩුවෝ දෙදෙන මා සමීපයෙහි සිටියහ. රාත්‍රියෙහි බොහෝ වේලාවක් දැහැමි කතාබහක යෙදී සිටි ඔවුන් නින්දට සූදානම් වන ආකාරය මම බලා සිටියෙමි. ඔවුහු බුදුරජාණන් වහන්සේ වැඩ සිටින දිශාවට හිස දමා මා සිටින දිශාවට පය දමා වැතිරුණෝ ය. මා දෙන බතින් යැපෙන, මා සපයන යානයෙන් ගමන් යන, මා නිසා ජීවත් වන නමුදු ඔවුහු මා කෙරෙහි ගෞරව නොදක්වා ඔබ වහන්සේ කෙරෙහි ම ගෞරව දැක්වූහ".

කොසොල් රජතුමා හෙළි කළ මෙම සිදුවීම තුළ අපට හමු වන්නේ, සැබෑ ශ්‍රද්ධාව ඇති ගිහි බෞද්ධයන් දෙදෙනෙකි. ඔවුන් එද ගෞරවාචාර දක්වා ඇත්තේ තමන්ට ආහාරපාන ආදිය සපයන මහරජුට නොව නිවන් මග හෙළි කරන බුදුරජාණන් වහන්සේට ය. එසේ තථාගතයන් වහන්සේගේ බුද්ධත්වය පිළිබඳ ව නුවණින් දැන ඇති කර ගත් පැහැදීම ඇත්තේ සැදැහැවතාටයි. ඔවුහු බත් පතට වඩා ගුණ නුවණට ගරු කරති.

"සැදැහැවත්කම" යනු සසර දුකින් එතෙර වීමට බුදුරජාණන් වහන්සේ වදාළ මගට පිවිසීමේ දෙරටුව ය. රාග, ද්වේශ, මෝහ ආදි සියලු කෙලෙස් මුලිනුපුටා දමන නිවන් මගට පිවිසෙන ශ්‍රාවකයා පළමු ව සැදැහැවත් විය යුතු ය. දුකින් මිදීමට අදාළ මග අනුපූර්ව ශික්ෂාවකි. අනුපූර්ව ක්‍රියාවලියකි. අනුපූර්ව ප්‍රතිපදාවකි. අනුපිළිවෙළින් යා යුතු ගමනකි. එහි පළමු පියවර ශ්‍රද්ධාවයි. **සැදැහැවත් තැනැත්තා දහම් ගුරුවරුන් වෙත එළැඹෙයි. එළඹ, ඇසුරු කරයි. ඇසුරු කරන්නේ, කන් යොමු කරයි. කන් යොමු කරන්නේ, දහම් අසයි. දහම් අසා සිත තබා ගනියි. සිත තබා ගෙන අරුත් විමසයි. අරුත් විමසා වටහා ගනියි. වටහා ගෙන ධර්මයෙහි කැමැති වෙයි. එහි හැසිරෙයි. භාවනාවට යොමු වෙයි. කෙළවර පරම සත්‍යය විනිවිද දකියි. ප්‍රත්‍යක්ෂ කරයි. නිවන් අවබෝධ කරයි.**

මෙසේ ශ්‍රද්ධාව මුල් කොට ගෙන නිවන් මගට පිවිස එහි ගමන් කරන ශ්‍රාවකයා සීලයෙන් සමාධියට ද, සීලයෙන් හා සමාධියෙන් ප්‍රඥාවට ද ළඟා වී රාග, ද්වේශ, මෝහ ආදි කෙලෙස් ගිනි නිවා සියලු දුක් නිම කරන්නේ ය. එබැවින්, ශ්‍රද්ධාව වැපිරිය යුතු බීජයක් ලෙස උගන්වා තිබේ.

ඒ භාග්‍යවතුන් වහන්සේ (සො භගවා) මේ කරුණු අනුව (ඉති පි) අරහං ගුණයෙන් යුක්තයහ, සම්මා සම්බුද්ධයහ, විජ්ජා චරණ සම්පන්නයහ, සුගතයහ, ලෝක විදූයහ ආදි වශයෙන් උන් වහන්සේගේ ගුණ මහිමය නුවණින් දැන, දැක ඇති කර ගත් පැහැදීම ශ්‍රද්ධාව ය. එසේ ම ඒ භාග්‍යවතුන් වහන්සේ විසින් දේශනා කරන ලද්දා වූ ධර්මය සන්දිට්ඨික ය, ඒහි පස්සික ය, ඕපනයික ය යනාදී වශයෙන් ධර්මයෙහි ගුණ මහිමය දැන දැක නුවණින් ඇති කර ගත් පැහැදීම ශ්‍රද්ධාව ය. ඒ බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවක වූ ආර්ය මහා සංඝ රත්නය සුපටිපන්න ය, උජුපටිපන්න ය ආදි වශයෙන් දැන දැක තේරුම් ගෙන ඇති කර ගත් පැහැදීම ශ්‍රද්ධාව ය. සැකෙවින් කියතොත් ත්‍රිවිධ රත්නය පිළිබඳ ඇති කර ගත් නිසැක බව ශ්‍රද්ධාවයි. එම ශ්‍රද්ධාව ඇති තැනැත්තා අනුපිළිවෙළින් ඉදිරියට යා යුතු නිවන් මගට පිවිසෙයි. මේ අනුව ශ්‍රද්ධාව යනු අවබෝධයෙන් තොර පැහැදීම හෝ අන්ධ භක්තිය හෝ නොවේ. පදනමක් නැති ඇදහීම හෝ අවිචාරවත් විශ්වාසය හෝ නොවේ. නුවණින් විමසා කරුණු තේරුම් ගෙන ත්‍රිවිධ රත්නයෙහි ගුණ මහිමය පිළිබඳ ව අප සිත් සතන් තුළ ඇති කර ගන්නා පැහැදීමයි.

එසේ ත්‍රිවිධ රත්නය පිළිබඳ කරුණු දැන ඇති කර ගන්නා පැහැදීම, අවෙච්චප්පසාදයයි. කරුණු නොදැන ද කෙනෙකුට බුදුරජාණන් වහන්සේ පිළිබඳ ව පැහැදීම ඇති විය හැකි ය. නිදසුනක් ලෙස ඇතැමෙකු බුදුරජාණන් වහන්සේ කෙරෙහි ප්‍රසාදය ඇති කොට ගෙන උන් වහන්සේ අනුගමනය කිරීමට පෙළඹුණේ උන් වහන්සේගේ රූප සම්පත්තිය හෙවත් බාහිර පෞරුෂය කෙරෙහි ඇති වූ ප්‍රසාදය හේතුවෙනි. බුදුරජාණන් වහන්සේ දවස විසූ වක්කලී හිමියන්ගේ පුවත මීට නිදසුනකි.

අවෙච්චප්පසාදය කෙනෙකු තුළ ඇති වනුයේ බුදුරජාණන් වහන්සේ දේශනා කරන ධර්ම මාර්ගය තමාගේ වර්තමාන ආගමික විශ්වාස හා සැසඳීමෙන් බුදුරජාණන් වහන්සේගේ ඉගැන්වීම කෙරෙහි ඇති වන සන්සන්දනාත්මක ඥානයෙනි. මෙය ඇති විය හැක්කේ අප ඉහතින් දුටු පරිදි බුදුරජාණන් වහන්සේ පිළිබඳ ව අසා ඉතා සරල ශ්‍රද්ධාවකින් උන් වහන්සේ වෙත එළඹෙන පුද්ගලයකු තුළ ය. උපතින් බෞද්ධයන් වන අප බොහෝ දෙනෙකු තුළ ද එක්තරා අවස්ථාවක දී ප්‍රසාදය මේ අයුරින් ඇති විය හැකි ය. එහෙත් අප බොහෝ දෙනෙකු දහම උපතින් ම පිළිගෙන ඇති බැවින් එසේ ඇති වීමේ හෝ නොවීමේ ගැටලුවක් පැන නොනගී.


ධර්මය කෙරෙහි ඇති වන ප්‍රසාදයෙහි ඊළඟ අවස්ථාව වනුයේ සත්‍යය අවබෝධ කිරීමත් ප්‍රඥාවෙන් ත්‍රිලක්ෂණය විනිවිද දැකීමත් ය. මෙම දෙපියවර නිර්වාණගාමී ප්‍රතිපදාවේ අවසානය වේ. ඉන් පැහැදිලි වන්නේ ඉතා සරල ශ්‍රද්ධාවකින් ආරම්භ කරන්නා වූ පුද්ගලයා පූර්ණ සත්‍යාවබෝධයෙන් ඇති වන ප්‍රඥාවෙන් තම ආගමික ප්‍රතිපදාව සම්පූර්ණ කරන බවයි. එම අවස්ථාව වන විට ශ්‍රද්ධාව වෙනුවට ප්‍රඥාව ඇති වී තිබේ. ඔහුට තව දුරටත් තෙරුවන පිළිබඳ ව විශ්වාස කිරීමට අවශ්‍ය නැත්තේ තෙරුවන පිළිබඳ ඥානය ඇති වී තිබෙන බැවිනි. ආරම්භයේ දී කරුණු දැන බුදුරජාණන් වහන්සේ සත්‍යාවබෝධය කොට ඇති බවත්, ධර්මය නිවනට පමුණුවන නිවැරැදි මාර්ගය බවත්, සංඝයා එම මගට පිළිපන් ජීවමාන ආදර්ශය බවත් විශ්වාස කරමින් ධර්මය පිළිපැදීම ආරම්භ කළ පුද්ගලයා මේ වන විට තෙරුවන පිළිබඳ ඉහත කී කරුණු තුන තම අවබෝධයෙන් ම දනී. ශ්‍රද්ධාවෙහි තැන ප්‍රඥාව විසින් ගනු ලැබ ඇත.

කරුණු නොදන පදනමකින් තොර ව ඇති වන ශ්‍රද්ධාව **අමූලික ශ්‍රද්ධා** (හෙවත් මුල් නැති ශ්‍රද්ධාව) ලෙස ද කරුණු දැනීමෙන් ඇති වන ශ්‍රද්ධාව **ආකාරවතී සද්ධා** (බුද්ධිමය ශ්‍රද්ධාව) ලෙස ද ධර්මයෙහි දැක්වේ. ඉහතින් දැක්වූ අවෙච්චප්පසාදය ඇති වනුයේ ආකාරවතී ශ්‍රද්ධාව තුළිනි. ආකාරවතී ශ්‍රද්ධාව ඇති වනුයේ කරුණු විමසීමෙන් බැවින් තෙරුවන පිළිබඳ ව කරුණු විමසීමට, පරීක්ෂා කිරීමට, ප්‍රශ්න කිරීමට, බුදුරජාණන් වහන්සේ අනුබල දී ඇත. බුදුරජාණන් වහන්සේගේ සිත දැන ගැනීමට ශක්තිය නැති (පරචිත්ත විජානන ඥානය නැති) ඕනෑ ම කෙනෙකුට තමන් වහන්සේ පිළිබඳ ව පරීක්ෂා කොට බලන ලෙස බුදුරජාණන් වහන්සේ අවසර දුන්හ. මාස ගණනක් බුදුරජාණන් වහන්සේ සමග එකට සිටිමින් උන් වහන්සේගේ පැවැත්ම පරීක්ෂා කළ බ්‍රහ්මායු නම් තරුණ බමුණෙකු ගැන ධර්මයෙහි සඳහන් වේ. බුදු දහමට අනුව විශ්වාසය ඇති කර ගත යුත්තේ හේතු සහිත ව ය. කරුණු දැන ගෙන ය. ඇත් අඩි උපමාව (චූල හත්ථි පදෝපම සූත්‍රය) වදළ බුදුරජාණන් වහන්සේ වඩාත් සමීප හේතු සාධක පමණක් සලකා බලා බුද්ධාදි රත්නත්‍රය පිළිබඳ නිගමනවලට නොඑළඹිය යුතු යැයි ඉගැන්වූහ. එහිලා දුර දක්නා නුවණ අවශ්‍ය ය. ආර්ය වූ ශීලස්කන්ධයෙන් ද, ඉන්ද්‍රිය සංවරයෙන් ද, සිහිනුවණින් ද යුක්ත ව සෙනසුනක භාවනා කරන ශ්‍රාවකයා නීවරණ දුරු කොට ධ්‍යාන උපදවයි. එහෙත් චතුර්විධ ධ්‍යාන අතුරින් එකකින් හෝ භාග්‍යවතුන් වහන්සේ සම්මා සම්බුද්ධ ය, ධර්මය ස්වාක්ඛාත ය, සංඝයා සුපටිපන්න යැයි නිගමනයකට නොපැමිණෙයි. එසේ ධ්‍යාන ලබා තවදුරටත් භාවනා කොට පුබ්බේ නිවාසානුස්සති හා දිබ්බචක්ඛු ඥානය ද ලබයි. එම ලෞකික අභිඥා තුළින් ද භාග්‍යවතුන් වහන්සේ සම්මා සම්බුද්ධ ය, ධර්මය ස්වාක්ඛාත ය, සංඝයා සුපටිපන්න යැයි නිගමනය නොකරයි. අවසානයේ දී එම ශ්‍රාවක තෙමේ සියලු කෙලෙස් නැති කොට ලෝකෝත්තර වූ ආසවක්ඛය ඥානය ලබා ගනී. හෙතෙම චතුරාර්ය සත්‍යය අවබෝධ කරයි. එවිට භාග්‍යවතුන් වහන්සේ සම්මා සම්බුද්ධ ය, ධර්මය ස්වාක්ඛාත ය, සංඝයා සුපටිපන්න යැයි නිශ්චය කරයි. කරුණු දැන හෝ කරුණු නොදැන හෝ ඇති වන ශ්‍රද්ධාවෙන් තොර ව අපට තෙරුවන පිළිබඳ ව ප්‍රසාදය ඇති නොවේ. ශ්‍රද්ධාව සහ ප්‍රසාදය නැති විට තෙරුවන වඳින්නේ වත් කුසලකර්ම කරන්නේ වත් ධර්ම මාර්ගය අනුග මනය කරන්නේ වත් නැත. එහෙයින් බෞද්ධයකු ලෙස අපට තිබිය යුතු මූලික ගුණාංගය "ශ්‍රද්ධාව" වේ. එය ඇති විට අප ආගමික ධනයෙන් පොහොසත් ය.

ශ්‍රද්ධාව උසස් ධනයකි. නිවන් මගෙහි යාමට අපට අවශ්‍ය මග වියදම් සපයන්නේ ශ්‍රද්ධාවයි. එය නැති නම් අප දහම් මග අනුගමනය නොකරන බැවිනි. සංසාරය නමැති සාගරය අප තරණය කරන්නේ ද ශ්‍රද්ධාව හේතුවෙනි. එසේ වන්නේ ශ්‍රද්ධාව නැති නම් අප දහම නොපිළිපදින අතර, දහම් නොපිළිපදින විට අප සසර තුළ ම රැඳෙන බැවිනි. ආගමික ජීවිතය නමැති අතුපතර ඇති වෘක්ෂයෙහි මූල බීජය වන්නේ ද ශ්‍රද්ධාවයි. බීජයකින් තොර ව ගසක් හට නොගන්නාක් මෙන් ශ්‍රද්ධාව නමැති බීජයෙන් තොර ව ආගමික ජීවිතය නමැති වෘක්ෂය නොහැදේ; නොවැඩේ. අපේ අරමුණ නිවන ය. නිවන යනු නිවීමයි, රාග දෝස මෝහ යන කෙලෙස් ගිනි නිවා ගැනීමයි. එය සම්පූර්ණයෙන් නිවී යන්නේ නිවන් දැකීමෙනි. අපේ ආගමික ජීවිතය ගත කළ යුත්තේ ටිකින් ටික හෝ රාග දෝස මෝහ තුනී වන ආකාරයට ය. රාගය නම් අරමුණුවල ඇලෙන ගතියයි. දෝසය නම් අරමුණු වල ගැටෙන ගතියයි. මෝහය නම් මුලා වන ගතියයි. ඒවා පාලනය කර ගැනීමට ශ්‍රද්ධාව බෙහෙවින් ම උපකාර වේ. සැදැහැති ව රාගාදිය අඩු කරමින් ආර්ය මාර්ගයේ


ගමන් කිරීම දෙලොව සැනසීමටත් නිවන් සැප ලැබීමටත් හේතු වන බැවින් අපි ද එසේ ක්‍රියා කිරීමට අධිෂ්ඨාන කර ගනිමු.

## සාරාංශය



ශ්‍රද්ධාව බෞද්ධ ප්‍රතිපදාවේ දෙරටුවයි. ඉන් අදහස් වන්නේ ත්‍රිවිධ රත්නය පිළිබඳ මනා අවබෝධයෙන් යුක්ත ව ඇති කර ගත් පැහැදීමයි. එම පැහැදීම ඔස්සේ නිවන් මග ගමන් කොට අවසානයේ දී සියලු කෙලෙස් නැති කිරීමෙන් සසර දුක නිම කොට නිවන් පසක් කළ හැකි ය. බුදුරජාණන් වහන්සේ වදාළ මෙකී ශ්‍රද්ධාව හුදු පැහැදීම, විශ්වාසය හෝ ඇදහීම නොවේ. තෙරුවන ගුණ දැන නුවණින් ඇති කර ගත් ප්‍රසාදයයි. එය ආකාරවතී ශ්‍රද්ධාව ලෙස හැඳින්වේ. ශ්‍රද්ධාව පෙරටු කරගෙන රාග දෝස මෝහ පාලනය කරමින් කටයුතු කරන තැනැත්තා නිවන අරමුණු කොට ආර්ය මාර්ගයේ ගමන් කරන්නෙකි.

## ක්‍රියාකාරකම



01. අමූලික ශ්‍රද්ධාව හා ආකාරවතී ශ්‍රද්ධාව වෙන වෙන ම හඳුන්වන්න.
02. ශ්‍රද්ධාව දියුණු කර ගැනීමට උපකාරී වන ක්‍රියාකාරකම් දෙකක් පැහැදිලි කරන්න.
03. රාග දෝස මෝහ පිළිබඳ ධර්මානුකූල කෙටි හැඳින්වීමක් ලියන්න.

## පැවරුම



විදුහල්පතිතුමාගේ අවසරය ඇති ව පන්ති භාර ගුරුතුමාගේ මග පෙන්වීමෙන් සුවිශේෂ වන්දනා චාරිකාවක සැලසුමක් සකස් කර ක්‍රියාත්මක කරන්න.